කටුනායක ගුවන් තොටුපළෙන් විදෙස්ගත වීමට පැමිණි අයෙකුගේ ගමන් මල්ලේ තිබී සොයාගත් පිස්තෝල උණ්ඩ ප්‍රමාණයක් මුදාහැරීම පිළිබඳ විමර්ශනයක් ඇරඹී ඇතැයි පුවතක්, අරුණ පුවත්පතේ (පෙබ. 02, 2023) පළ වී තිබේ.
මෙම පුවත් අන්තර්ගතය තුළ සඳහන් වන්නේ, අදාළ පුද්ගලයා "මුස්ලිම් ජාතික" ව්‍යාපාරිකයෙකු බවයි.
මාධ්‍ය ආචාර ධර්ම දක්වන ආකාරයට, යම් පුද්ගලයෙකුගේ වාර්ගිකත්වය හෝ ආගමිකත්වය පුවතකට ඇතුළත් විය යුත්තේ, එය එම පුවතට සෘජුවම අදාළ වේ නම් පමණි.
ඒ අනුව,
1) මෙම පුද්ගලයාගේ වාර්ගිකත්වය මෙම පුවතට අදාළ යැයි ඔබ සිතන්නේ ද?
2) මෙම පුද්ගලයාගේ වාර්ගිකත්වය පුවතට අදාළ නොවන්නේ නම්, එය "මුස්ලිම්" යනුවෙන් පුවත තුළ ඉස්මතු කොට දක්වා ඇත්තේ මන්ද?
3) එසේ අදාළ නොවන වාර්ගිකත්වයක් සෘණාත්මක පසුබිමක ඉස්මතු කොට දැක්වීම ඔස්සේ, එම වාර්ගිකත්වයන් සෘණාත්මකව ඒකාකෘතික වීමක් සිදු නොවන්නේ ද?
**Ethics Eye නිරීක්ෂකයෙකු වීමට ඔබත් කැමතිද? එසේ නම්, ඔබ හඳුනාගන්නා මාධ්‍ය ආචාර ධර්ම කඩ කිරීම් අප වෙත එවන්න.
***අපගේ නිරීක්ෂණයන් WhatsApp ඔස්සේ නොමිලේ ලබා ගන්න! ඔබගේ නම සහ WhatsApp අංකය සෘජු පණිවිඩයක් (DM/inbox) හරහා අප වෙත එවා, දැන්ම Ethics Eye subscriber කෙනෙකු වන්න!

